

# සැබෑ මිනිසුන්ගේ

2009 ජුනි
21 වෙනි ඉරිද

## යතාර්ථවාදී අවශ්‍යතාවයන්

# ලෝක සරණාගතයන්ගේ ඉරුදිනය

යුද්ධය සහ ආපදවන්, පිඩාකිරීම් සහ ත්‍රස්තවාදය නිසා පලවාහරින ලද සරණාගතයන් සහ කලින් කලට අවතැන් වන පුද්ගල යන් වෙනුවෙන් යාච්ඤා කිරීම සඳහා සමස්ත ලෝකයේම කිතුනු සභාව වන අපි අද එක්රැස්ව සිටිමු. මිලියන 33 කට වඩා ජනතාවක් අද තම හිසට වහලක් නොමැතිව දිවිගෙවති. ඔවුන්ට ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් ද යහළුවන් ද අහිමිවීත් සමඟ සෑම බලාපොරොත්තුවක්ම ද බිඳ වැටී ඇත. මෙමඟින් මොවුන් හදිසි සංක්‍රමණයන්ට ද නොයෙක් වෙනස්කම් වලටද මුහුණ දීමත් සමඟ නොයෙක් සූරාකෑම් වලට ද ලක් වෙති.

"මා ආගන්තුකව සිටියෙමි, නුඹලා මා පිළිගත්තහුය!…. සැබවක් නුඹලාට කියමි. මාගේ මේ සහොදරයන්ගෙන් ඉතා කුඩා කෙනෙකුට නමුත් නුඹලා ඒක කලහුද ඒක කළේ මටයයි කියන සේක".
මතෙව් 25:35,40

කරුණාකර යාච්ඤා කරන්න:

• විදේශිය රාජ්‍යයන් මෙම සරණාගත ජනතාව වෙත අනුකම්පාවෙන් සහ ප්‍රඥාවන්තව විවෘත හදවතකින් ඇතිව සැබෑ අවශ්‍යතාවයක් ඇති සරණාගතයන් හට නැවතත් එම රටවල පදිංචි විමට ඉඩ ලබාදෙන ලෙසටත් එම ප්‍රතිපත්තිය නිසියාකාරව සරණාගතයන්ට රැකවරණයක් ලැබෙන අයුරින් ක්‍රියාත්මක වන පිණිසත්.

• සරණාගතයින්ට පිඩාකරන සහ ඔවුන් පලවාහරින පුද්ගලයන් ඔවුන්ගේ ක්‍රියාවන් ගැන පසුතැවිල්ලට පත්වන පිණිස.

• අවතැන්වුවන් වෙත උපකාරකිරීමට යොමුවන සේවකයන්ගේ ආරක්ෂාව සඳහා යාච්ඤා කිරීම සහ හදිසි අවසථාවන් වලදී උසස් ආත්මික තත්වයකින් සේවය සිදුකිරීමට සහ හදවත් විවෘත කරන්නන් සමඟ ක්‍රිස්තුන් වහන්සේ ගැන ප්‍රකාශ කිරීම සඳහා.

• මෙම පිඩාකාරී තත්ත්වය යටතේ පලායන සරණාගතයන්ගේ හදවත් සමාදනයෙන් පිරෙන්නටත් ඔවුන් මෙම කුණාටුවට හසු නොවිමටත් යාච්ඤා කර ඔවුන්ට ප්‍රේමය සහ හොඳ පිළිගැනීමක් ලැබෙන පිණිසත් දෙවියන් වහන්සේ සමඟ සම්බන්ධ වීමට පිපාසයක් ඇති අයට උන්වහන්සේ මුණගැසේන ලෙසත් යච්ඤා කරන්න.



NCEASL

රිෆියුජි හයිවේ පාට්නර්ෂිප් සහ ලෝක ඉවැන්ජලිස්ත සන්ධානය සමඟ එක්ව ලෝක සරණාගතයන්ගේ ඉරුදින සමරනු ලබයි.
සරණාගතයන් සහ අවතැන්වුවන් පිළිබඳව වැඩි විස්තර සඳහා www.RefugeeHighway.net.